# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2079/28 - 2018 ජූලි මස 10 වැනි අඟහරුවාදා - 2018.07.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### පඩිපාලක සභා ආඥාපනත

නිවේදනයයි.

**තේ පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට තේ පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වන වගන්තියේ විධිවිධාන අනුව, මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දැක්වෙන විරෝධතාවයන් 2018 ජූලි මස 26 වැනි දින දහවල් 12.00 දක්වා මා විසින් භාර ගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, එම විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතු ය.

ඒ. විමලවීර,
සභාපති,
තේ පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2018 ජූලි මස 04 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

තේ පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, 1945 ජූලි මස 21 වැනි දින අංක 9436 දරන අති *විශෙෂ ගැසට්* පත්‍රයෙහි පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කලට වෙනස් කරන ලද්දා වූ ද, අවසන් වරට 2012 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1789/19 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි පළකරන ලද දැන්වීම්වලින් වෙනස්

කරන ලද්දා වූ ද, තීරණ එම උපලේඛනයේ II කොටස වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් සංශෝධනය කළ යුතු ය.

## II වැනි කොටස

### සේවකයාගේ පන්තිය

**II වැනි ශ්‍රේණිය :**

සැම්පල් පිළියෙල කිරීම, පෙට්ටිවල පියන් හැර එහි ඇතුළත දේ පිටට හැලීම, හිස් පෙට්ටිවල බර කිරීම, පැක් කිරීම, කඩදාසි හා ඊයම් කොළ කැපීම, පෝරු දැමීම, පෙට්ටිවල තේ ඇහිරීම, එළියේ තැබීම, උඩ පැත්ත පෝරු කිරීම හා ගිනි වතුරෙන් පැස්සීම, පියන් දැමීම හා ඇණ ගැසීම, වලයන් දැමීම හා කම්බි දැමීම, පරණ සලකුණ සූරා දැමීම, ලකුණු කිරීම හා අච්චුවෙන් අකුරු දැමීම, ඊයම් පැකට් සෑදීම හා ගිනි වතුරෙන් පැස්සීම, පැකට්ටු සෑදීම, බර කිරීම, පැකට්ටු කිරීම, ලේබල් ඇලවීම, ජුටේසින් කවර කැපීම හා සෑදීම, ජුටේසින්වලින් එතීම, ස්ටෝරු හා කාණු ශුද්ධ කිරීම හා පිස දැමීම, කැපීම හා ඇවිස්සීම හා නැවත ගින්නෙන් රත් කිරීම, අමු තේ පාට කිරීම යන මේවායේ නිරත සේවකයෝ.

**මධ්‍යම ශ්‍රේණිය :**

තේ පුරවා පෙට්ටි කිරීම, අතින් බල්ක් කිරීම, අතින් කලවම් කිරීම යන මේවායේ නිරත සේවකයෝ, පෙට්ටි සාදන්නන් හා අලුත්වැඩියා කරන්නන්,

**1 වැනි ශ්‍රේණිය :**

පෙට්ටි බෑම හා ගෙන යාම, අඩුක් කිරීම, කලවම් කරන තැනට පෙට්ටි ගෙන යාම, ස්ටෝරුවට ගෙන ගොස් නැවත අඩුක් කිරීම, පෙට්ටි එළියේ දැමීම, නැවට යැවීමට පැටවීම යන මේවායේ නිරත සේවකයෝ,

**මුරකරුවන් :**

**මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

| *සේවා වසර* | *II ශ්‍රේණිය රු. ශත.* | *මධ්‍යම ප්‍රමාණය රු. ශත.* | *I ශ්‍රේණිය රු. ශත.* | *මුරකරුවන් රු. ශත.* |
|---|---|---|---|---|
| 1 වසර | 14,000.00 | 14,616.00 | 15,225.00 | 14,000.00 |
| 2 වසර | 14,100.00 | 14,741.00 | 15,375.00 | 14,100.00 |
| 3 වසර | 14,200.00 | 14,866.00 | 15,525.00 | 14,200.00 |
| 4 වසර | 14,300.00 | 14,991.00 | 15,675.00 | 14,300.00 |
| 5 වසර | 14,400.00 | 15,116.00 | 15,825.00 | 14,400.00 |
| 6 වසර | 14,500.00 | 15,241.00 | 15,975.00 | 14,500.00 |
| 7 වසර | 14,600.00 | 15,366.00 | 16,125.00 | 14,600.00 |
| 8 වසර | 14,700.00 | 15,491.00 | 16,275.00 | 14,700.00 |
| 9 වසර | 14,800.00 | 15,616.00 | 16,425.00 | 14,800.00 |
| 10 වසර | 14,900.00 | 15,741.00 | 16,575.00 | 14,900.00 |
| 11 වසර | 15,000.00 | 15,866.00 | 16,725.00 | 15,000.00 |
| 12 වසර | 15,100.00 | 15,991.00 | 16,875.00 | 15,100.00 |
| 13 වසර | 15,200.00 | 16,116.00 | 17,025.00 | 15,200.00 |
| 14 වසර | 15,300.00 | 16,241.00 | 17,175.00 | 15,300.00 |
| 15 වසර | 15,400.00 | 16,366.00 | 17,325.00 | 15,400.00 |
| 16 වසර | 15,500.00 | 16,491.00 | 17,475.00 | 15,500.00 |
| 17 වසර | 15,600.00 | 16,616.00 | 17,625.00 | 15,600.00 |
| 18 වසර | 15,700.00 | 16,741.00 | 17,775.00 | 15,700.00 |
| 19 වසර | 15,800.00 | 16,866.00 | 17,925.00 | 15,800.00 |
| 20 වසර | 15,900.00 | 16,991.00 | 18,075.00 | 15,900.00 |
| 21 වසර | 16,000.00 | 17,116.00 | 18,225.00 | 16,000.00 |
| 22 වසර | 16,100.00 | 17,241.00 | 18,375.00 | 16,100.00 |
| 23 වසර | 16,200.00 | 17,366.00 | 18,525.00 | 16,200.00 |
| 24 වසර | 16,300.00 | 17,491.00 | 18,675.00 | 16,300.00 |
| 25 වසර | 16,400.00 | 17,616.00 | 18,825.00 | 16,400.00 |
| 26 වසර | 16,500.00 | 17,741.00 | 18,975.00 | 16,500.00 |

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**රබර් පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් රබර් පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට එම පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වන වගන්තියේ විධිවිධාන අනුව, මෙයින් නිවේදනය කරනු ලැබේ.

යෝජිත තීරණය සම්බන්ධයෙන් දැක්වෙන විරෝධතාවයන් 2018 ජූලි මස 26 වැනි දින දහවල් 12.00 දක්වා මා විසින් භාර ගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, එසේ විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතු ය.

**ඒ. විමලවීර,**
සභාපති,
රබර් පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2018 ජූලි මස 04 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

**රබර් පිටරට යැවීමේ කර්මාන්තය** පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, වර්ෂ 1945 ජූලි මස 21 වැනි දින අංක 9436 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළවූ නිවේදනයෙහි වූ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කල වෙනස් කරන ලද්දා වූ ද, අවසන් වරට 2012 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1789/19 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි පළ වූ නිවේදනය මගින් වෙනස් කරන ලද, තීරණ එම උපලේඛනයේ II කොටස වෙනුවට පහත සඳහන් නව කොටස් ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

II වැනි කොටස

මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය

සේවක පන්තිය

**II වැනි ශ්‍රේණිය**

ෂීට් ගැලවීම, පලුදු කපා දැමීම, බාක් කැපීම, පුස්කාපු රබර් සේදීම සහ නැවත දුම් ගැස්සීම පැස්වලටත්, තරාදිවලටත්, ගබඩාවේ වෙනත් තැන්වලටත් ගෙනයාම ඇතුළුව කම්කරුවන් කරන සාමාන්‍ය වැඩ, ගොඩ ගැසීම, බේල් කිරීම සඳහා රබර් කුත්තු කිරීම සහ එතීම, පැසේ දමා තද කිරීම, වලයන්වලින් හා කම්බිවලින් බැඳීම, ජුටෙසින් කවර කැපීම, පින්තාරු කිරීම, වේලීම, ගොඩ ගැසීම, ලකුණු කිරීම, විශේෂ ඇහිරීම සඳහා ජුටෙසින්වල හුණු ගෑම, රබර් බේල් ජුටෙසින්වලින් ඔතා මැහුම් දැමීම, මිටි බිම දැමීම, ගබඩා සහ කාණු පිරිසිදු කිරීම හා පිස දැමීම යන මේවායේ නිරත කම්කරුවෝ.

**මධ්‍යම ශ්‍රේණිය**
කිරීම, වර්ග කිරීම හා තේරීම, ප්‍රෙස් ක්‍රියා කරවීමේ වැඩ යන මේවායේ නිරත කම්කරුවෝ.

**I** වැනි ශ්‍රේණිය
පැටවීම, බෑම හා මිටි ගෙන යාම, අඩුක්කු කිරීමෙහි නියත කම්කරුවෝ සහ තේරීමේ නිරත කම්කරුවෝ

මුරකරුවන්

| *සේවා වර්ෂය* | *II ශ්‍රේණිය රු. ශත.* | *මධ්‍යම ශ්‍රේණිය රු. ශත.* | *I ශ්‍රේණිය රු. ශත.* | *මුරකරුවන් රු. ශත.* |
|---|---|---|---|---|
| 1 වසර | 14,000.00 | 14,601.00 | 15,210.00 | 14,000.00 |
| 2 වසර | 14,100.00 | 14,726.00 | 15,360.00 | 14,100.00 |
| 3 වසර | 14,200.00 | 14,851.00 | 15,510.00 | 14,200.00 |
| 4 වසර | 14,300.00 | 14,976.00 | 15,660.00 | 14,300.00 |
| 5 වසර | 14,400.00 | 15,101.00 | 15,810.00 | 14,400.00 |
| 6 වසර | 14,500.00 | 15,226.00 | 15,960.00 | 14,500.00 |
| 7 වසර | 14,600.00 | 15,351.00 | 16,110.00 | 14,600.00 |
| 8 වසර | 14,700.00 | 15,476.00 | 16,260.00 | 14,700.00 |
| 9 වසර | 14,800.00 | 15,601.00 | 16,410.00 | 14,800.00 |
| 10 වසර | 14,900.00 | 15,726.00 | 16,560.00 | 14,900.00 |
| 11 වසර | 15,000.00 | 15,851.00 | 16,710.00 | 15,000.00 |
| 12 වසර | 15,100.00 | 15,976.00 | 16,860.00 | 15,100.00 |
| 13 වසර | 15,200.00 | 16,101.00 | 17,010.00 | 15,200.00 |
| 14 වසර | 15,300.00 | 16,226.00 | 17,160.00 | 15,300.00 |
| 15 වසර | 15,400.00 | 16,351.00 | 17,310.00 | 15,400.00 |

07-809/2

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි.

**සිනමා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් සිනමා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට සිනමා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වන වගන්තියේ විධිවිධාන අනුව, මෙයින් නිවේදනය කරනු ලැබේ.

යෝජිත තීරණය සම්බන්ධයෙන් දැක්වෙන විරෝධතාවයන් 2018 ජූලි මස 26 වැනි දින දහවල් 12.00 දක්වා මා විසින් භාර ගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, එසේ විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතු ය.

**ඒ. විමලවීර,**
සභාපති,
සිනමා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2018 ජූලි මස 06 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

***උපලේඛනය***

**සිනමා කර්මාන්තය** පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, වර්ෂ 1949 මාර්තු මස 30 වැනි දින අංක 9961 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි පළවූ නිවේදනයේ වූ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කලට වෙනස් කරන ලද්දා වූ ද, අවසන් වරට 2012 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1789/19 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි පළවූ නිවේදනය මගින් වෙනස් කරන ලද, තීරණ එම උපලේඛනයේ II කොටස වෙනුවට පහත සඳහන් නව කොටස් ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

## I වැනි කොටස

සිනමා කර්මාන්තයේ නියුක්ත පහත සේවක පන්තිවලට අදාළ කම්කරුවන්ට කාල මිම්මේ වැඩ වෙනුවෙන් අදාළ වන අවම මාසික වේතන ප්‍රමාණය පිළිවෙලින් මහ නගර සීමාව තුළ සිනමා ශාලාවන්ට සහ මහ නගර සීමාවෙන් පිටත සිනමා ශාලාවන්ට අදාළ වන පරිදි I වගුවෙන් සහ II වගුවෙන් දක්වා ඇත.

**සේවක පන්තිය**

**'ඒ' ලිපිකාර නොවන**

**නුපුහුණු**
ප්‍රසිද්ධ කිරීමේ කරත්ත අදින්නා, ප්‍රසිද්ධ කිරීමේ හෝ පෝස්ටර් පත්‍රකාරයා, නාන කාමර සේවක, කාර් හෝ බයිසිකල් නැවතුම්පොළ සේවක, චොක්ලට්කාරයා, ක්ලීනර්, ක්ලෝක්රූම් සේවකයා, කසල ශෝධකයා, තෝට කාරයා, ගේට්ටුකාරයා, පියුන්, සැන්ඩ්විච්කාරයා, (චිත්‍රපට) ශාලා සේවකයා, සිසිල්බීමකාරයා, ප්‍රගුණ නොවූ කම්කරුවා, අසුන් පෙන්වන්නා, වේටර්, කාවල්කාරයා (දවල්) කාවල්කාරයා (රාත්‍රී)

**අර්ධ පුහුණු**
සහකාර බාර් කීපර්, සහකාර ඇන්ජින් ඩ්‍රයිවර්, චෙකර්, කෝකි II ශ්‍රේණිය (පහළ), රිවයින්ඩර් ටෙලිෆෝන් ඔපරේටර්, තුන්වන සහකාර ඔපරේටර්,

**පුහුණු II ශ්‍රේණිය**
සහකාර ඔපරේටර්, බාර් කීපර්, වඩු කෝකි I ශ්‍රේණිය (ඉහළ) විදුලි කාර්මික II ශ්‍රේණිය, චිත්‍රපට කාමරය අලුත්වැඩියා කරන්නා II ශ්‍රේණිය, නොන්සිව් ඔපරේටර්, දෙවන සහකාර ඔපරේටර්, පරිපාලන හෝ ප්‍රධාන චෙකර්, කූඩාරම් පාලක, වයර් මෑන්, ෆයර් මෑන්

**පුහුණු I ශ්‍රේණිය**
ප්‍රධාන ඔපරේටර් (I ශ්‍රේණිය), ආම්චර් ඔතන්නා, විදුලි කාර්මිකයා (I ශ්‍රේණිය), ඇන්ජින් ඩ්‍රයිවර්, චිත්‍රපට කාමර අලුත්වැඩියා කරන්නා I ශ්‍රේණිය, කූඩාරම් සවි කරන්නා.

**'බී' ලිපිකාර**

**III ශ්‍රේණිය**
ප්‍රසිද්ධ කරන ලිපිකරු, සහකාර මුදල් භාර ලිපිකරු, යවන හා ඉවත් කරන ලිපිකරු, කලින් ආසන වෙන් කරන ලිපිකරු, ආසන වෙන් කරන ලිපිකරු

**II ශ්‍රේණිය**
ප්‍රසිද්ධ කරන කළමනාකාර, සහකාර මුදල් භාර ලිපිකරු, ලිපිකරු (ගිණුම් හා සාමාන්‍ය) ටයිප් කරන්නා, වාප්පු ලිපිකරු, ගබඩාකරු, ගණන් තබන්නා.

**I ශ්‍රේණිය**
ප්‍රධාන ලිපිකරු

**අනෙක් අය**
කළමණාකරුවන්, සහකාර කළමනාකරු

**මහ නගර සීමාව තුළ**

| *සේවක පන්තිය* | *අවම මාසික වේතනය*<br>*සේවා වර්ෂය* | | | | |
|---|---|---|---|---|---|
| | 1 වන වසර | 2 වන වසර | 3 වන වසර | 4 වන වසර | 5 වන වසර |
| "ඒ" ලිපිකාර නොවන | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| නුපුහුණු | 12,000.00 | 12,100.00 | 12,200.00 | 12,300.00 | 12,400.00 |
| අර්ධ පුහුණු | 12,447.00 | 12,572.00 | 12,697.00 | 12,822.00 | 12,947.00 |
| පුහුණු II ශ්‍රේණිය | 13,149.00 | 13,299.00 | 13,449.00 | 13,599.00 | 13,749.00 |
| පුහුණු I ශ්‍රේණිය | 14,344.00 | 14,519.00 | 14,694.00 | 14,869.00 | 15,044.00 |
| "බී" ලිපිකාර | | | | | |
| III ශ්‍රේණිය | 12,447.00 | 12,572.00 | 12,697.00 | 12,822.00 | 12,947.00 |
| II ශ්‍රේණිය | 13,108.00 | 13,258.00 | 13,408.00 | 13,558.00 | 13,708.00 |
| I ශ්‍රේණිය<br>ප්‍රධාන ලිපිකාර | 13,939.00 | 14,114.00 | 14,289.00 | 14,464.00 | 14,639.00 |
| අනෙක් අය | | | | | |
| කළමනාකරු | 14,836.00 | 15,011.00 | 15,186.00 | 15,361.00 | 15,536.00 |
| සහකාර කළමනාකරු | 12,960.00 | 13,110.00 | 13,260.00 | 13,410.00 | 13,560.00 |

මහ නගර සීමාවෙන් පිටත :

| සේවක පන්තිය | අවම මාසික වේතනය<br>සේවා වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | 1 වන වසර | 2 වන වසර | 3 වන වසර | 4 වන වසර | 5 වන වසර |
| "ඒ" ලිපිකාර නොවන | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| නුපුහුණු | 12,048.00 | 12,148.00 | 12,248.00 | 12,348.00 | 12,448.00 |
| අර්ධ පුහුණු | 12,548.00 | 12,673.00 | 12,798.00 | 12,923.00 | 13,048.00 |
| පුහුණු II ශ්‍රේණිය | 13,243.00 | 13,393.00 | 13,543.00 | 13,693.00 | 13,843.00 |
| පුහුණු I ශ්‍රේණිය | 14,438.00 | 14,613.00 | 14,788.00 | 14,963.00 | 15,138.00 |
| "බී" ලිපිකාර | | | | | |
| III ශ්‍රේණිය | 12,548.00 | 12,673.00 | 12,798.00 | 12,923.00 | 13,048.00 |
| II ශ්‍රේණිය | 12,548.00 | 12,698.00 | 12,848.00 | 12,998.00 | 13,148.00 |
| I ශ්‍රේණිය<br>ප්‍රධාන ලිපිකාර | 13,682.00 | 13,857.00 | 14,032.00 | 14,207.00 | 14,382.00 |
| අනෙක් අය | | | | | |
| කළමණාකරු | 14,586.00 | 14,761.00 | 14,936.00 | 15,111.00 | 15,286.00 |
| සහකාර කළමණාකරු | 12,656.00 | 12,806.00 | 12,956.00 | 13,106.00 | 13,256.00 |

07-809/3

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි.

**පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වන වගන්තියේ විධිවිධාන අනුව, මෙයින් නිවේදනය කරනු ලැබේ.

යෝජිත තීරණය සම්බන්ධයෙන් දැක්වෙන විරෝධතාවයන් 2018 ජූලි මස 26 වැනි දින දහවල් 12.00 දක්වා මා විසින් භාර ගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, එසේ විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතු ය.

ඒ. විමලවීර,
සභාපති,
පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2018 ජූලි මස 06 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, වර්ෂ 1949 අප්‍රේල් මස 30 වැනි දින අංක 99/71 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කලට වෙනස් කරන ලද්දා වූ ද, අවසන් වරට 2013 නොවැම්බර් මස 27 වැනි දින අංක 1838/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පල වූ නිවේදනය මගින් වෙනස් කරන ලද තීරණ එම උපලේඛනයේ II කොටස වෙනුවට පහත සඳහන් නව කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

එම උපලේඛනයේ II වැනි කොටසේ කැලි මිම්මේ සේවකයන්ට ගෙවිය යුතු අවම වැටුප් ප්‍රමාණයන් මෙසේය.

| කාර්යය | පඩි ප්‍රමාණය<br>රු. |
|---|---|
| 1) වැවිල්ල දැමීම හා නඩත්තු කිරීම, පොල් කැඩීම, ගස් 1000 ක | 2,391.00 |
| 2) කොප්පරා තැනීම, පොල් ලෙලි ගැසීම, පොල් බිඳීම, කොප්පරා වේලීම හා තේරීම - ගෙඩි 1000 ක් | 700.00 |

**III වැනි කොටස**

(2) කාර්යයන්

(අ) පොල් වැවිල්ලක් වගා කිරීම හා පවත්වාගෙන යෑම.

(ආ) කොප්පරා සෑදීම.

ඉහත සඳහන් කාර්යයන් සම්බන්ධයෙන් කාල මිම්මේ අවම වැටුප් ප්‍රමාණයන් වන්නේ

| | |
|---|---|
| සියලු කම්කරුවන් සඳහා දිනකට | රු. 600.00 |

ගව පාලනයේ නිරත යම් සේවකයෙකුට වැඩ වේලා සඳහා ඉරිදාට ගෙවිය යුතු පඩි ප්‍රමාණය විය යුත්තේ, මෙම කොටසේ කලින් දී ඇති විධිවිධානවලට ඇතුළත් කිසියම් ප්‍රතිවිරෝධී කරුණකින් ප්‍රතිශෝධනය නොවූ වැඩ කර කරන සාමාන්‍ය දවසකට එබඳු සේවකයෙකුට ගෙවිය යුතු පඩි ප්‍රමාණය මෙන් එකහමාර ගුණයකි.

III "ඒ" වැනි කොටස

*(අ)* කොන්දොස්තර කෙනෙකුගේ වැඩවලට

*(ආ)* මුරකරුවෙකුගේ වැඩවලට

අදාළ කාල මිම්මේ අවම වැටුප් ප්‍රමාණය වන්නේ :

| *අක්කර ප්‍රමාණය* | *මුරකරු රු.* | *කොන්දොස්තර රු.* |
|---|---|---|
| (1) අක්කර 10 ට නොඅඩු එහෙත් අක්කර 25 ට අඩු පොල් වැවිල්ලක් හෝ කොටසක නම් | 15,000.00 | අදාළ නැත |
| (2) අක්කර 25 ට නොඅඩු එහෙත් අක්කර 50 ට අඩු පොල් වැවිල්ලක් හෝ කොටසක නම් | 15,647.00 | 16,080.00 |
| (3) අක්කර 50 ට වැඩි පොල් වැවිල්ලක් හෝ කොටසක් නම් | 17,931.00 | 18,364.00 |

07-809/4

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**පිඟන් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් මෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට පිඟන් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව අදහස් කරන බැව් එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වන වගන්තියේ විධිවිධාන අනුව, මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දැක්වෙන විරෝධතාවයන් 2018 ජුලි මස 26 වැනි දින දහවල් 12.00 දක්වා මා විසින් භාර ගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, එම විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතු ය.

**ඒ. විමලවීර,**
සභාපති,
පිඟන් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2018 ජුලි මස 04 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

පිඟන් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් තීරණය කරන ලදුව, 1999 සැප්තැම්බර් මස 28 වැනි දින අංක 1099/07 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කලට වෙනස් කරන ලද්දා වූ ද, අවසන් වරට 2013 ජනවාරි මස 03 වැනි දින අංක 1791/33 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද නිවේදනයෙන් වෙනස් කරනු ලැබූ තීරණ, එම උපලේඛනයට පහත සඳහන් ඡේදයන් ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

**සේවකයන්ගේ පන්තිය**

**පුහුණු**
අංශ නියාමකයින්, විවිධ යන්ත්‍ර ක්‍රියා කරවන්නන්, මෝස්තර අඳින්නන්, චාර්ජ් හැන්ඩ්ර්වරුන්, දහන යන්ත්‍ර ක්‍රියාකරුවන්, උඳුන් ක්‍රියාකරවන්නන්, ජ්‍යෙෂ්ඨ ලිෆ්ට් ඔපරේටර්, අච්චු ශිල්පීන්, පර්යේෂණ සහායකයන්, මූර්ති ශිල්පීන්, චිත්‍ර ශිල්පීන්, හරි වැරදි බලන්නන්, විදුලි කාර්මිකයන්

**අර්ධ පුහුණු**
සහකාර අච්චු ශිල්පීන්, වර්ණ ගන්වන්නන් (ස්ප්‍රේ කරන්නන් සහ ඩීපර්ස්) තෝරන්නන්, කණිෂ්ඨ ලිෆ්ට් ඔපරේටර්, පොලිෂ් කරන්නන්, අසුරන්නන්, නිෂ්පාදන සුද්ද කරන්නන්, ස්ටිකර් අලවන්නන්, ෂවල් ලෝඩර් ඔපරේටර්, සහකාර යන්ත්‍ර ක්‍රියාකරු, විදුලි උත්පාදක යන්ත්‍ර ක්‍රියාකරු, උඳුන් සහායක ක්‍රියාකරු.

**නුපුහුණු**
පිරිසිදු කරන්නන්, අත් උදව්කරුවන්, සාමාන්‍ය වැඩකරුවෝ, වතුවැඩ කරන්නන් සහ වෙනත් අනුශාංගික සේවාවල නිරතවන්නන්

**ආධුනිකයින්**
අවුරුදු දෙකක පුහුණු කාල සීමාවකට යටත්ව විවිධ කාර්යයන්හි වැඩ ඉගෙන ගන්නා අය.

මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය

| *සේවා වර්ෂය* | *පුහුණු*<br>*රු. ශත* | *අර්ධ පුහුණු*<br>*රු. ශත* | *නුපුහුණු*<br>*රු. ශත* | *ආධුනිකයින්*<br>*රු. ශත* |
|---|---|---|---|---|
| 1 වන වර්ෂය | 12,627.00 | 11,769.00 | 11,000.00 | 6,693.00 |
| 2 වන වර්ෂය | 12,777.00 | 11,894.00 | 11,100.00 | 6,793.00 |
| 3 වන වර්ෂය | 12,927.00 | 12,019.00 | 11,200.00 | |
| 4 වන වර්ෂය | 13,077.00 | 12,144.00 | 11,300.00 | |
| 5 වන වර්ෂය | 13,227.00 | 12,269.00 | 11,400.00 | |

07-809/5

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි.

**විස්කෝතු හා රසකැවිලි (චොක්ලට් සෑදීම ඇතුළුව) සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පවරා ඇති බලතල ප්‍රකාර, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට විස්කෝතු හා රසකැවිලි (චොකලට් සෑදීම ඇතුළුව) සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී ආඥාපනතේ 28 වන වගන්තියේ විධිවිධාන අනුව, මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දැක්වෙන විරෝධතාවයන් 2018 ජූලි මස 26 වැනි දින දහවල් 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාර ගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම එසේ විරුද්ධ වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් විය යුතු ය.

**ඒ. විමලවීර,**
සභාපති,
විස්කෝතු හා රසකැවිලි (චොකලට් සෑදීම ඇතුළුව)
සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2018 ජූලි මස 04 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

විස්කෝතු හා රසකැවිලි (චොක්ලට් සෑදීම ඇතුළුව) සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, 1968 ජුනි මස 14 වැනි දින අංක 14806 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළවූ නිවේදනයේ උපලේඛනයෙහි දක්වා ඇත්තා වූ ද, කලින් කල වෙනස් කරනු ලද්දා වූ ද හා අවසන් වරට 2012 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1789/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද තීරණ එම උපලේඛනයේ II වැනි කොටස වෙනුවට පහත සඳහන් අළුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

**II කොටස**

විස්කෝතු හා රසකැවිලි (චොක්ලට් සෑදීම ඇතුළුව) සෑදීමේ කර්මාන්තයේ නියුක්ත පහතින් දක්වා ඇති සේවක පන්තිවලට අදාළ කම්කරුවන්ට කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අවම මාසික වේතන ප්‍රමාණයන් පිළිවෙලින් යන්ත්‍රානුසාරයෙන් වැඩ කරන කර්මාන්ත ශාලාවන්ට සහ අතින් වැඩ කරන කර්මාන්ත ශාලාවන්ට අදාළ වන පරිදි I වගුවෙන් සහ II වගුවෙන් දක්වා ඇත.

**සේවක පන්ති**

**"ඒ" ශ්‍රේණියේ කම්කරුවෝ (පුහුණු)**

(අ) විස්කෝතු සෑදීම

*පහත සඳහන් කාර්යයන්හි යෙදී සිටින කම්කරුවෝ*

පදම් පිටි අනන බාල්දි සහ භාජන පිරිසිදු කිරීම ඇතුළුව අවශ්‍ය ද්‍රව්‍ය කිරා බැලීම සහ මැනීම, රසායන ද්‍රව්‍ය මිශ්‍ර කිරීම, සාර වර්ග හා පාට වර්ග දැමීම හා මිශ්‍රණ යන්ත්‍රවලට ද්‍රව්‍ය පිරවීම ඇතුළුව පදම් පිටි ඇනීම සම්බන්ධ කාර්යයන්, කපන යන්ත්‍රය සම්බන්ධ කාර්යයන්, කැපීමේ හා තෙරපීමේ කටයුතු සම්බන්ධ කාර්යයන්, පෝරණුවලට තැටි දමන්නන්ගේ හා පෝරණු සහායකවරුන්ගේ කාර්යයන් ඇතුළුව විස්කෝතු පිච්චීම, අට්ටි ගැසීම යන්ත්‍ර සම්බන්ධ කාර්යයන්.

(ආ) රසකැවිලි සෑදීම

*පහත සඳහන් කාර්යයන්හි යෙදී සිටින කම්කරුවෝ*

අවශ්‍ය ද්‍රව්‍යයන් උණු කිරීම, හොට් ටේබල්වලින් බැච් *නොහොත්* කැටි කළ මිශ්‍රණය එහා මෙහා මාරුකිරීම සම්බන්ධ කාර්යයන්, කූල් ටේබල්ස්වලින් බැච් *නොහොත්* කැටිකළ මිශ්‍රණය එහා මෙහා මාරු කිරීම සම්බන්ධ කාර්යයන්, බැච්රීඩර් යන්ත්‍ර සම්බන්ධ කාර්යයන්, බැච් *නොහොත්* කැටි කළ මිශ්‍රණය බන්දේසිවලට හිස් කිරීම සම්බන්ධ කාර්යයන්, කපන සහ ඔතන යන්ත්‍රය සම්බන්ධ කාර්යයන්, ටැබ්ලටිං යන්ත්‍රය සම්බන්ධ කාර්යයන්, සෙන්ටර් මනුෆැක්චරින් යන්ත්‍රය හා සම්බන්ධ කාර්යයන්, කැට කරන යන්ත්‍රය සම්බන්ධ කාර්යයන්.

**"බී" ශ්‍රේණියේ කම්කරුවෝ (අර්ධ පුහුණු)**

(අ) විස්කෝතු සෑදීම

*පහත සඳහන් කාර්යයන්හි යෙදී සිටින කම්කරුවෝ*

පිටි සහ සීනි, මාජරින්, එළවළු තෙල්, ග්ලූකෝස් ලෙසිටයින්, සාර වර්ග, කොකෝවා, පිටි, චීස්, මෝල්ට්, මිල්ක් පවුඩර්, රසායන ද්‍රව්‍ය, බටර්, ඇමෝනියා, බේකිං පවුඩර්, බිත්තර හා වෙනත් ද්‍රව්‍යයන් බාරගැනීම හා ගබඩා කිරීම සම්බන්ධ කාර්යයන්, විස්කෝතු සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය පැටවීම, බෑම සහ ගෙනයාම සම්බන්ධ කාර්යයන්, පිටි හැලීම සම්බන්ධ කාර්යයන්, මිශ්‍ර පදම් පිටි, භාජන කපන මේසයෙහි ඇතිරීම, දිගහැරීම හා තුනී කිරීම, විස්කෝතු ටින් හා පැකට් ගෙනයෑම, අට්ටි ගැසීම, පැටවීම සහ බෑම ආදී කටයුතු සම්බන්ධ කාර්යයන්, පැකට්වල ඇහිරීම, තාප මුද්‍රාතැබීම, කුඩා පෙට්ටිවල ඇහිරීම සහ කුඩා පෙට්ටි ඇලවීම.

(ආ) රස කැවිලි සෑදීම

*පහත සඳහන් කාර්යයන්හි යෙදී සිටින කම්කරුවෝ.*

ග්ලූකෝස්, සීනි සාර වර්ග, කොකෝ ඇට, මිල්ක් පවුඩර්, එළවළු, බටර්, ජෙලටින්, රසායන ද්‍රව්‍ය හා රස වර්ග ඇතුළු අවශ්‍ය ද්‍රව්‍යයන් බාරගැනීම සහ ගබඩා කිරීම සම්බන්ධ කාර්යයන්, අවශ්‍ය ද්‍රව්‍යයන් කිරා බැලීම, මැනීම සහ මිශ්‍ර කිරීම, ටොෆි සම්බන්ධ කාර්යයන්, අවශ්‍ය ද්‍රව්‍යයන් කිරා බැලීම, මැනීම සහ මිශ්‍ර කිරීම, ටොෆි, චොක්ලට් හා රසකැවිලි කිරා බැලීම සහ ඇහිරීම, බන්දේසිවල රසකැවිලි එකතු කිරීම හා රසකැවිලි තාප කරන කාමරයේදී රසකැවිලි එකතු කිරීම හා රසකැවිලි තාප කරන කාමරයේදී වේලීම, ජෙලටින් හා පාට වර්ග යෙදීම, ජුජුබ්ස් බන්දේසිවල එකතු කිරීම, කිරා බැලීම සහ ඇහිරීම, රසකැවිලි සහ චොක්ලට් එතීම, ලේබල් ගැසීම සහ ඇහිරීම සහ රසකැවිලි සෑදීමට අදාළ වැඩවලට සම්බන්ධ වූ හෝ ඊට ආනුෂංගික වූ වෙනත් කාර්යයන්.

**"සී" ශ්‍රේණියේ කම්කරුවෝ (නුපුහුණු)**

(අ) විස්කෝතු සෑදීම

*පහත සඳහන් කාර්යයන්හි යෙදී සිටින කම්කරුවෝ*

පදම් වූ පිටි කැට කුඩු කිරීම සම්බන්ධ කාර්යයන්, පිච්චූ විස්කෝතු නිවීමේ රාක්කයෙන් එහා මෙහා ගෙනයාම, තැටි සහ භාජන සේදීම සහ පිරිසිදු කිරීම, කැපූ විස්කෝතු එකතු කිරීම සහ පිළියෙල කිරීම සහ විස්කෝතු සෑදීමට අදාළ වැඩවලට සම්බන්ධ හෝ ඊට අනුශාංගික වූ වෙනත් කාර්යයන්.

(ආ) රස කැවිලි සෑදීම

*පහත සඳහන් කාර්යයන්හි යෙදී සිටින කම්කරුවෝ*

රසකැවිලි, චොක්ලට් සහ ටොපි තේරීම, බැග් මුද්‍රා තැබීම, චොක්ලට් අච්චු පිරවීම, අච්චුවලින් චොක්ලට් ගැලවීම.

**වගුව I**

අවම මාසික වේතන ප්‍රමාණය

*යන්ත්‍රානුසාරයෙන් වැඩ කරන කර්මාන්ත ශාලාවක් වූ විට*

| *කම්කරුවාගේ පන්තිය* | *1 සේවා වසර* | *2 සේවා වසර* | *3 සේවා වසර* | *4 සේවා වසර* | *5 සේවා වසර* |
|---|---|---|---|---|---|
| **"ඒ" ශ්‍රේණියේ කම්කරුවෝ (පුහුණු)** | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| (අ) විස්කෝතු සෑදීම | 14,689.00 | 14,839.00 | 14,989.00 | 15,139.00 | 15,289.00 |
| (ආ) රසකැවිලි සෑදීම | 14,689.00 | 14,839.00 | 14,989.00 | 15,139.00 | 15,289.00 |
| **"බී" ශ්‍රේණියේ කම්කරුවෝ (අර්ධ පුහුණු)** | | | | | |
| (අ) විස්කෝතු සෑදීම | 14,126.00 | 14,251.00 | 14,376.00 | 14,501.00 | 14,626.00 |
| (ආ) රසකැවිලි සෑදීම | 14,126.00 | 14,251.00 | 14,376.00 | 14,501.00 | 14,626.00 |
| **"සී" ශ්‍රේණියේ කම්කරුවෝ (නුපුහුණු)** | | | | | |
| (අ) විස්කෝතු සෑදීම | 13,563.00 | 13,663.00 | 13,763.00 | 13,863.00 | 13,963.00 |
| (ආ) රසකැවිලි සෑදීම | 13,563.00 | 13,663.00 | 13,763.00 | 13,863.00 | 13,963.00 |

**වගුව II**

අවම මාසික වේතන ප්‍රමාණය

*අතින් වැඩ කරන කර්මාන්ත ශාලාවක් වූ විට*

| *කම්කරුවාගේ පන්තිය* | *1 සේවා වසර* | *2 සේවා වසර* | *3 සේවා වසර* | *4 සේවා වසර* | *5 සේවා වසර* |
|---|---|---|---|---|---|
| **"ඒ" ශ්‍රේණියේ කම්කරුවෝ (පුහුණු)** | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| (අ) විස්කෝතු සෑදීම | 14,070.00 | 14,220.00 | 14,370.00 | 14,520.00 | 14,670.00 |
| (ආ) රසකැවිලි සෑදීම | 14,070.00 | 14,220.00 | 14,370.00 | 14,520.00 | 14,670.00 |
| **"බී" ශ්‍රේණියේ කම්කරුවෝ (අර්ධ පුහුණු)** | | | | | |
| (අ) විස්කෝතු සෑදීම | 13,507.00 | 13,632.00 | 13,757.00 | 13,882.00 | 14,007.00 |
| (ආ) රසකැවිලි සෑදීම | 13,507.00 | 13,632.00 | 13,757.00 | 13,882.00 | 14,007.00 |
| **"සී" ශ්‍රේණියේ කම්කරුවෝ (නුපුහුණු)** | | | | | |
| (අ) විස්කෝතු සෑදීම | 13,000.00 | 13,100.00 | 13,200.00 | 13,300.00 | 13,400.00 |
| (ආ) රසකැවිලි සෑදීම | 13,000.00 | 13,100.00 | 13,200.00 | 13,300.00 | 13,400.00 |

07-809/6

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.